# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.11.04 පැය 0550 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1984/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු**

## 01. මනුෂ්‍ය ඝාතනයක් - මධ්‍යම කඳවුර පොලිස් වසම

2025.11.03 වන දින රාත්‍රී කාලයේදී තුවාල සහිතව මධ්‍යම කඳවුර රෝහල වෙත ඇතුළත් කල පුද්ගලයෙක් රෝහලට ඇතුලත් කරන විටත් මියගොස් සිට ඇති බවට මධ්‍යම කඳවුර පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ වීරගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා තවත් පුද්ගලයින් දෙදෙනෙකු අතර ඇතිවූ පැරණි ආරවුලක් දුරදිග යාමෙන් මරණකරු හට පොල්ලකින් හිසට පහරදීම හේතුවෙන් මෙම ඝාතනය සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වි ඇත. අපරාධයට සම්බන්ධ සැකකරුවන් දෙදෙනා අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීරය මධ්‍යම කඳවුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මධ්‍යම කඳවුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. කුෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකය.

2025.11.03 වන දින අළුයම් කාලයේ ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන්තොටුපල උප ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර ගුවන් මඟින් මෙරටට රැගෙන එන ලද **කුෂ් මත්ද්‍රව්‍ය කිලෝ 02 ග්‍රෑම් 79 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 29 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන් තොටුපොල ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි..

## 03. දුම්රිය අනතුරක් - රාගම පොලිස් වසම.

2025.11.03 වන දින උදෑසන කාලයේ රාගම පොලිස් වසමේ වල්පොල දුම්රිය හරස් මාර්ගයේදී කඳාන දෙස සිට රාගම දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් දුම්රිය ආරක්ෂක ගේට්ටු වසා තිබියදී දුම්රිය මාර්ගය හරහා ගමන් කිරීමට උත්සාහ කිරීමේදී මඩකලපුව සිට කොළඹ කොටුව බලා ධාවනය වූ සීඝ්‍රගාමී දුම්රියේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථ රියදුරු එම ස්ථානයේදීම මියගොස් ඇති අතර එහි ගමන් ගත් ඔහුගේ බිරිඳ හා මව බරපතල තුවාල ලබා ප්‍රතිකාර සඳහා රාගම රෝහලට ඇතුළත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් වූ කඳාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර රාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - මොරගහහේන පොලිස් වසම.

2025.11.03 වන දින සවස් කාලයේ මොරගහහේන පොලිස් වසමේ හොරණ පාදුක්ක මාර්ගයේ මොරගහහේන හන්දිය ආසන්නයේදී හොරණ දෙස සිට පාදුක්ක දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කරගත නොහැකිව මාර්ගයේ පෙරළී ගොස් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි කාර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ත්‍රීරෝද රථ රියදුරු ප්‍රතිකාර සඳහා හොරණ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ බොරලැස්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ කාර් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මොරගහහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - බඩල්ගම පොලිස් වසම.

2025.11.03 වන දින සවස් කාලයේ බඩල්ගම පොලිස් වසමේ මීගමුව මීරිගම මාර්ගයේ කිලෝමීටර් 22 කණුව ආසන්න ප්‍රදේශයේදී බඩල්ගම දෙස සිට මීරිගම දෙසට ධාවනය වූ ලොරි රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි වාහනයකට ඉඩ ලබාදීමට යාමේදී රියදුරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් පිටතට පැන පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ලොරි රථයේ රියදුරු හා එහි ගමන් ගත් පුද්ගලයින් දෙදෙනෙකු ප්‍රතිකාර සඳහා අකරගම සහ කුරුණෑගල රෝහල් වෙත ඇතුලත් කිරීමේදී අකරගම රෝහලට ඇතුළත් කළ ලොරි රථයේ ගමන් ගත් එක් පුද්ගලයෙකු මියගොස් ඇති අතර අනෙක් පුද්ගලයා මීගමුව රෝහල වෙත වැඩිදුර ප්‍රතිකාර සඳහා යොමු කර ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ දිවුල්දෙණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තුවාලකරුවන් මේ වන විට කුරුණෑගල සහ මීගමුව රෝහල් වල ප්‍රතිකාර ලබන අතර බඩල්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - බෙලිඅත්ත පොලිස් වසම.**

2025.11.03 වන දින දහවල් කාලයේ බෙලිඅත්ත පොලිස් වසමේ බෙලිඅත්ත දික්වැල්ල මාර්ගයේ කුඩාහිල්ල ප්‍රදේශයේදී බෙලිඅත්ත දෙස සිට දික්වැල්ල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් පිටතට පැන පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් රියදුරු ලෙස කටයුතු කළ කාන්තාව බරපතල තුවාල ලබා ප්‍රතිකාර සඳහා බෙලිඅත්ත රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා තංගල්ල රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 46 ක් වූ නාකුළුගමුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය තංගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බෙලිඅත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මාරක රිය අනතුරක් - පොළොන්නරුව පොලිස් වසම.**

2025.11.03 වන දින උදෑසන කාලයේ පොළොන්නරුව පොලිස් වසමේ හබරණ මඩකලපුව මාර්ගයේ කඩවලවැව ප්‍රදේශයේදී කඩවලවැව දෙස සිට බැඳිවැව දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් පිටතට පැන දුරකථන රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා ප්‍රතිකාර සඳහා පොළොන්නරුව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වූ නිකවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පොළොන්නරුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. මාරක රිය අනතුරක් - මැදවච්චිය පොලිස් වසම.**

2025.11.03 වන දින දහවල් කාලයේ මැදවච්චිය පොලිස් වසමේ ඒ 09 මාර්ගයේ කිලෝමීටර් 149 කණුව ආසන්න ප්‍රදේශයේ මාර්ගය අසල කැලෑවක් එළිපෙහෙලි කර ගිනිතබා තිබියදී එම ස්ථානය පසුකර අනුරාධපුර දෙස සිට මැදවච්චිය දෙසට ධාවනය වූ යතුරු පැදියක පැදිකරුට දුම සහ ගිනි දැල් හේතුවෙන් මාර්ගය අපහැදිලිවීම හේතුවෙන් යතුරුපැදිය පාලනය කරගත නොහැකිව ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පැමිණි බස් රථයක ගැටී අනතුරක් සිදුව ඇත.අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු ප්‍රතිකාර සඳහා මැදවච්චිය රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වූ රඹෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ බස් රථ රියදුරු සහ කැලෑව ගිනි තැබීම හා එයට අනුබලදීම සම්බන්ධව සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර මැදවච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. මාරක රිය අනතුරක් - මුරුන්කන් පොලිස් වසම.**

2025.11.03 වන දින රාත්‍රී කාලයේ මුරුන්කන් පොලිස් වසමේ මුරුන්කන් සිලාවතුර මාර්ගයේ පරිහරිකන්ඩල් ප්‍රදේශයේදී සිලාවතුර දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් ගමන් කළ ටිපර් රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව

ඇත.අනතුරින් තුවාල ලැබූ ත්‍රීරෝද රථ රියදුරු හා එහි ගමන් ගත් පුද්ගලයින් දෙදෙනෙකු ප්‍රතිකාර සඳහා මුරුන්කන් රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් පුද්ගලයෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වූ සිලාවතුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මුරුන්කන් රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත.මුරුන්කන් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - කලවාන පොලිස් වසම.

2025.11.03 වන දින රාත්‍රී කාලයේ කලවාන පොලිස් වසමේ වැද්දාගල කලවාන මාර්ගයේ කොස්වත්ත හන්දිය ආසන්නයේදී වැද්දාගල දෙසට මුහුණලා නවතා තිබූ ත්‍රීරෝද රථයක රියදුරු රථයට ගොඩවන අවස්ථාවේදී කලවාන දෙස සිට වැද්දාගල දෙසට ධාවනය වූ වෑන් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ත්‍රීරෝද රථ රියදුරු ප්‍රතිකාර සඳහා කලවාන රෝහලට ඇතුලත් කිරීමෙන් එක් පුද්ගලයෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 65 ක් වූ සිලාවතුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කලවාන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අනතුරට සම්බන්ධ වෑන් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කලවාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**